# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-10-30 |
|---|---|---|

පැමිණිලිකාරිය : ජේ. ඩී. ධර්මලතා මිය.
නො : 67, කන්දවත්ත පාර,
නුගේගොඩ.

වගඋත්තරකරුවන් : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත, කොළඹ 10.

<u>පැමිණිලි අංකය : **HRC/1966/13/L-13**</u>

පැමිණිල්ල :-

මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප 1989 සිට ලබා ඇති අයෙක් වන අතර, 2013 වසරේ සිට ඇය ලබමින් සිටි ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප වගඋත්තරකරුවන් විසින් නතර කරන ලද බවත්, මේ පිළිබඳව සොයා බැලීමේදී වයස අවුරුදු 26 සම්පූර්ණවීමෙන් පසුව ආබාධිත තත්ත්වයට පත්වී ඇති බැවින්, නව රෙගුලාසිවලට අනුව මෙසේ සිදු කළ බවට සඳහන් කරන ලද නමුත් තමාට කුඩා අවධියේ සිට මෙම ආබාධිත තත්ත්වය තිබූ බවත්, තමාගේ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප නතර කිරීම තමා හට වෙනස්කොට සැලකීමක් බවත්, පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත.

2012 වසරේදී පැමිණිලිකාරිය වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් වීමෙන් පසු වයස අවුරුදු 34 දී පැමිණිලිකාරියගේ පාදයේ තිබූ ආබාධයකට ශල්‍ය කර්මයක් සිදු කිරීම මත මෙම ආබාධිත තත්ත්වය වයස අවුරුදු 34 දී ඇති වී ඇති බවට වෛද්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව ප්‍රකාශ කර ඇති නමුත් එම ආබාධිත තත්ත්වයට අවුරුදු 34 දී ශල්‍යකර්මයක් සිදු කළද, ඊට පෙර සිට එම ආබාධිත තත්ත්වය තිබූ බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකරුවන් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2009 සඳහන් විධිවිධාන අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිශෝධනය


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

හා යළි උපලේඛන ගත කිරීම සිදු කරන ලද බවත්, ඒ අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම මෙම චක්‍රලේඛනය පනවන අවස්ථාව වනවිට ගෙවමින් පැවති ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප යළි උපලේඛන ගත කළ බවත්, මෙම අයදුම්පත් කමිටුවක් විසින් පරීක්ෂා කර බලා පූර්ණ ආබාධිත තත්ත්වයක් නිරූපනය වන අවස්ථාවන්හිදී අඛණ්ඩව ගෙවීම් කරන ලද බවත් ප්‍රකාශ කර ඇත. එහිදී කමිටු නිර්දේශ මත විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවීම හෝ යළි වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන්නේ නම්, එය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කළයුතු බැවින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සහිතව ජේ. ඩී. ධර්මලතා යන පැමිණිලිකාරිය වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ඇති බවත්, වෛද්‍ය මණ්ඩල වාර්තාව අනුව ජේ. ඩී. ධර්මලතා මෙනවිය ආබාධිත තත්ත්වයට පත්වී ඇත්තේ වයස ඇවුරුදු 26 ක් සම්පූර්ණ වූ පසු බවත්, එනම් අනත්දරු වයස (26) ඉක්මවීමෙන් පසුව බවට අනාවරණය වූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තවදුරටත් ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ඇය වෙත ගෙවීමට නොහැකි බව ලිඛිතව දැනුම්දී ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :-

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත 1981 අංක 44 දරණ පනතින් සංශෝධනය කිරීමෙන් පසු 1981 ජූනි 02 දින සිට ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයෙකුව සිටි අයෙකුගේ දරුවෙකු/දැරියක ශාරීරිකව හෝ මානසිකව නිත්‍ය දුබලතාවයකින් පෙළෙන්නේ නම් එම අනත් දරුවාගේ/දැරියගේ වයස ගැන නොතකා ඇයට හෝ ඔහුට යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇත.

ඉහත පනතේ 29 (අ) වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවෙකු ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නාවූ ශාරීරික හෝ මානසික අශක්‍යතාවයකින් පෙළෙන බවට තීරණය කළවිට, ඒ අනත්දරුවාට වයස ගැන නොතකා මෙම ආඥා පනත යටතේ යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් තිබිය යුතු බවට දක්වා ඇත.

පැමිණිලිකරුට ඉහත පනතේ ප්‍රතිපාදන අනුව අනත්දරු ආබාධිත විශ්‍රාම වැටුප 1989.10.29 දින සිට 2012 ජූලි මාසය දක්වා වසර 23 ක කාලයක් ගෙවා ඇත අතර, වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය අනුව 1/2009 චක්‍රලේඛයේ විධිවිධාන මත ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම ප්‍රතිශෝධනය හා යළි උපලේඛනගත කිරීම පදනම් කර ගනිමින් පැමිණිලිකාරිය වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කොට ආබාධිත තත්ත්වයට පත්වී ඇත්තේ වයස අවුරුදු 34 දී බැවින් හා එනම්, අනත්දරු වයස අවුරුදු 26 ඉක්මවීමෙන් අනතුරුව බැවින් ගෙවමින් සිටි ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප අත්හිටුවා ඇත.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනතට ගෙන එන ලද සංශෝධන අනුව 1981 අංක 44 දරණ පනතේ 29 (අ) වගන්තිය මෙතෙක් සංශෝධනය වී නොමැත. එවැනි තත්ත්වයක් තුළ චක්‍රලේඛයක් 1/2009 මගින් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කිරීම මෙහිදී සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

29 (අ) වගන්තයෙහි අරමුණ වී ඇත්තේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකුව සිටි අයකුගේ දරුවකුගේ/දැරියක ශාරීරිකව හෝ මානසිකව නිත්‍ය දුබලතාවයකින් පෙළෙන්නේ නම් එම දරුවාගේ /දැරියගේ වයස ගැන නොතකා ඇයට හෝ ඔහුට යාවජීව විශ්‍රාම වැටුපක් ලබාදීම වේ. එයින් පරිබාහිරව එම පුද්ගලයා දුබලතාවයකට පත්වූයේ කිනම් වයසේදීද යන්න සලකා බැලීම මෙම වගන්තියේ ප්‍රතිපාදන නොමැති බව නිරීක්ෂණය වේ.

නිර්දේශය :-

ඉහත නිරීක්ෂණ සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරියට ගෙවමින් සිටි විශ්‍රාම වැටුප නතර කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියට හිමිවිය යුතු ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප නතර කළ දින සිට ඉදිරියට ගෙවිය යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 11 .29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/